# කඳ සුරිඳුගේ පූජාසන වත්කම් අස්ථානගතවන බැතිමතුන් මංකොල්ල කරුවන්ගේ ගොදුරක් වන හා ජයසිරි මහ බෝධිය වැඳ පුදා ඥාණක්කාගේ දේවාලේ පූජා පවත්වා කොළඹ එන බැතිමතුන්ට අකල් මරණ

යන්ත්‍ර මන්ත්‍ර භාවිතයේදී බුදුදහම සම්බන්ධ කර ගන්නා බව කොළඹ විශ්ව විද්‍යාලය විසින් සම්පාදිත දේශීය වෙදකම හා බැඳුණු යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් පිළිබඳ පර්යේෂණාත්මක කෘතියේ  මෙසේ සඳහන් වෙනවා.

˝අනවින කොඩිවින සිදුකරන යන්ත්‍ර  මන්ත්‍ර ද ඇතැම්හු ළඟ සුරක්ෂිතව තබාගෙන සිටිනු දක්නට ලැබුණි. එහෙත් ඒවායේ පවතින අයහපත් තත්ත්වය නිසා ඒවා කිසිසේත් පරීක්ෂා කිරීමට පවා අවස්ථාව ලබා නොදුනි. ඒ කෙරෙහි අපගේ ද සැලකිල්ල යොමු නොවුයේ එය අප සතු පරීක්ෂණ ක්ෂේත්‍රයේ තේමාව නොවුනු බැවිනි.

ඇත්තටම එය පරීක්ෂණ කණ්ඩායම හෝ පොතේ කතෘ වන ප්‍රධාන සම්පාදක රංජිත් සේනානායක හා සහය සම්පාදක රජිත් නාමසිංහගේ කාර්යභාරය එසේ විය හැකිද?

මෙය වගකීම් පැහැර හැරීමේ ලක්ෂණයක් ඉන් ප්‍රකට නොකරන්නේ ද යන ප්‍රශ්නයක් මතු වෙනවා. සම්ප්‍රදාය නිසා හෝ වැඩිහිටියෙක් කිවුව නිසා හෝ හිතට යමක් සිතුන නිසා හෝ යමක් නොපිළිගන්නා ලෙසත් ඒවා නිරීක්ෂණය, සම්පරීක්ෂණය, නිගමනය තුලින් ඔප්පු කල යුත්තේ උගත් විද්වත් සමාජ කණ්ඩායම්.

එය ඔප්පු වෙනවනම් සත්‍ය පිළිගන්න නැතිනම් පිළිගන්න එපා කියලා අදාල පූර්ව නිගමනයක ක්‍රියාකරන්න මේ කණ්ඩායමට හැකියාව නොලැබීම ඉතාමත් කණගාටුවට කරුණක්.

බොරුව තාවකාලිකයි. සත්‍ය සදාතනිකයි. මිත්‍යාව හා සත්‍ය අතර ගැටුම් මෙවැනි විශ්ව විද්‍යාලයක සමාජ සමීක්ෂණයක ප්‍රධාන තේමාව විය යුතු බව හරය කරගෙන මේ පොත සම්පාදනය වූවා නම් වඩාත් වැදගත් කාර්යභාරයක් පොත තුලින් පාඨකයාට උත්තේජනය කරනු ඇත.

අපගේ පුරවැසි ජීවන පැවැත්ම තුල ලොව සියල්ලටම මුල් වන්නේ ද්‍රව්‍යයයි. ද්‍රව්‍ය පංචේන්ද්‍රයන්ට විෂය වී මොලයට යන්නේ දෙවැනියට.

එවැනි සමාජ වටපිටාවක සත්‍ය තුලින් ඔප්පු කල යුතු දේ ආගමික පරිසරය තුලින් පුලුස්සා මරා දැමීමට අවකාශය හෝ පිටු බලය ලබා දිය යුතු නොවේ.

මේ සඳහා නිවැරදි අවබෝධය සියල්ලන් තුල විශේෂයෙන් පරීක්ෂණ කණ්ඩායම් තුල තිබුණානම් වඩාත් වැදගත් නොවේද? කියවීම, ඇසීම, දැකීම ආදී කරුණු වලින් නිරීක්ෂණ භුක්තිය අපට වර්ධනය වෙනවා.

සුවිශේෂ සමාජ කාරණා වලදී මෙවැනි සමීක්ෂණ යථාරූපීව හඳුනාගෙන හෙලිදරව් කිරීම ජීවමාන සංකේතයක් බවට අදාල හෙලිදරව් තුලින් මතු කිරීම ඉතාම වැදගත් කරුණක්.

ඇත්තටම මේ කෘතිය තුලින් බෞද්ධ සදාචාර මූලධර්ම කෙරෙහි එල්ලවිය හැකි ප්‍රබල අභියෝග වසාදැමීම සඳහා ගත් උත්සාහයක් ද යන්න පැන නගින ප්‍රශ්නයක්.

මිනිස් සදාචාරය මෙන්ම වෙනත් විඥාණමය තත්ත්වයන් මිනිසා ජීවත් කරන සමාජ ආර්ථික පරිසරය බුද්ධිමය සංවාදයට ලක් කිරීම සමීක්ෂණ ග්‍රන්ථයක ප්‍රධාන කාර්යභාරය විය යුතු නොවේද?
සමාජය ආධ්‍යාත්මිකව හා භෞතිකව ම වෙනස් කල හැක්කේ එවිට නොවේද?

භෞතික සාධක වෙනස් කිරීම සඳහා සමාජ සාධාරණත්වය ඉටු කිරීම ඉතා ම සමීක්ෂණ ග්‍රන්ථයක කාර්යක්ෂම භූමිකාවක්.

අකාර්යක්ෂම හා අයුක්ති සහගත ලෙස එය පැහැර හරින්නේ නම් ඉන් ඇතිකරන අක්‍රමිකතා පරිහානිය සමාජ පඪිතයක් සේ දිවයන සුලුයි. එය අතීතයෙන් වර්තමානයත් වර්තමානයෙන් අනාගතයටත් කාන්දු කරන සමාජ පඪිතයක් වෙන්න පුලුවන්.

මේ පරීක්ෂණ ග්‍රන්ථයේ අභිප්‍රාය හා අධ්‍යාපන චේතනා ඇති සාධක න්‍යායන් ගැඹුරට වටහාගෙන කෘතිය නිර්මාණය කලේ නම් වඩාත් වැදගත්.

පරාර්ථකාමීත්වයෙන් තොරව ආත්මාර්ථකාමී බලලෝභී පිරිස් වලට පොදු යහපත පිණිස සමාජ ජීවිතයේ පරිවර්ථනයන් කිරීමට ජනතාවගේ ඥාණය ඥාණ මණ්ඩලයක් කරා ගෙන යාමට හැකියාව තිබූ අවස්ථාව මෙයින් පැහැරහැර තිබෙනවාද යන්න මතුවෙන තවත් ගැටලුවක්.

හෙලිදරව් වන හෝ හෙලිදරව් නොවන සියලු කරුණු සත්‍ය හෝ අසත්‍ය විය හැකියි. විශ්වාසය මත පිහිටි ප්‍රජාවගේ ආකල්ප වලට තෙවැනි ඇසක් ලබාදීම මෙවැනි සමාජ සමීක්ෂණ ග්‍රන්ථයක ප්‍රධාන භූමිකාවක්.

අසත්‍ය සෙවීමද ඒ තුලින් යම් ප්‍රඥාවක් ජනතාවට කාන්දු කිරීමද ඉතාමත් සදාචාරාත්මක විනිශ්චයක්.

පුද්ගල රුචි අරුචිකම් මනෝභාවාත්මක තත්ත්ව මත විශ්ව විද්‍යාලයකට හැසිරීමට පුලුවන් ද?

මේ මේ මිනුම් දඬු මත අදාල සමීක්ෂණය කරන්නේ යැයි පූර්ව නිගමන වලට පත්විය හැකිද?

මිනිස් ඥාණය හා සත්‍ය සමග සම්බන්ධතාවය විනිවිද දකින්න හා ඒ තුලින් විද්‍යාත්මක විප්ලවයක් සඳහා මග පෑදීම මෙවැනි සමීක්ෂණ කෘතියක තවත් සාධනීය කරුණක් නොවේද?

මිනිස් සමාජයේ ප්‍රගතිය කෙරෙහි පුද්ගල සදාචාරාත්මක ආර්ථික සමාජීය සංස්කෘතික පරිසරය තුල මිත්‍යාව විශ්වාසය හා සමාජ යථාර්ථය හෙලිදරව් කිරීම මෙවැනි කෘතියක වඩාත් උපාය මාර්ගික කාර්ය භාරයක්.

ආකල්ප හා සම්ප්‍රදායන් මත පදනම්ව මෙවැනි සමීක්ෂණ වල යෙදීම කිසිසේත්ම බුද්ධිමය සමාජයට නොගැලපෙන්නක්.

සදාචාර සාරධර්ම මිනිස් ස්භාවයත් මිනිස් ඉරණමත් මිනිසා ජීවත් වන ලෝකයේ ස්වභාවයත් හොඳ නරක පාරම්පරික සම්ප්‍රදායානුකූල මත ගතානුගතිකව පමණක් ආත්මගත වීම මෙවැනි කෘතියක කාර්යභාරය නොවේ.

සමාජ සමීක්ෂණ කණ්ඩායම් ලබන අත්දැකීම් පදනම් කරගෙන හොඳ නරක පිළිබඳ විනිශ්චය කල යුතු බව බුදුන්වහන්සේගේ මතයයි.

කාලාම සූත්‍රය දෙන ලද මහඟු උපදේශාත්මක පණිවිඩ වලින් ඒ බව තහවුරු වෙනවා.

තමාටද අනුන්ටද එකසේ පීඩාකාරී වන දේ කවරේදැයි සොයා ගැනීම සමාජ සමීක්ෂණ කණ්ඩායමේ ප්‍රධාන වගකීමක්.

මිත්‍යා විශ්වාස සහ සමාජ යථාර්ථය ඇත්තටම තේරුම්ගෙන විවිධ උපායමාර්ගිකව ඒ සඳහා තොරතුරු මෙවැනි සමීක්ෂණයකදී යොදාගැනීම ඉතාම වැදගත්. එය ලෝභයත්, ද්වේශයත්, මෝහයත් මත නොවේ.

යථාර්ථය පිළිබඳ විමසා බැලීමට මෙවැනි සමීක්ෂණ කණ්ඩායම් වලට ලැබෙන අනගි අවස්ථාව උපරිම ප්‍රජාවගේ සතුට හා බුද්ධිමය ප්‍රඥාව සඳහා මෙවලමක් කර ගැනීම ඉතාම වැදගත් භූමිකාවක්.

විද්‍යාත්මක නිපදවීම් තුලින් මිනිසා තව තවත් දුකට පත්වන බව භෞතික ලෝකයේ පෙනෙන විනිවිද සමාජ සාධකයක්.

විද්‍යා ඥාණය ලෝකයේ යොමු වී ඇත්තේ ලෝකය සහ මිනිසාගේ දියුණුව සඳහා පමණක් බව තීරණය කරන්න පුලුවන්. එහිදී ඇත්තට ම පැහැදිලිව තේරුම්ගත යුතු වැදගත් කරුණු අප්‍රමාණව තියෙනවා.

අධ්‍යාපනය, සංවර්ධනය, සිවිල් යුද්ධ, ජාතිකවාදී අධ්‍යාපනය තුල කුලවාදය කුලය මත පදනම්ව ජීවත්වන සමාජ අසමානතාවයන්ගෙන් හෙබි පුරවැසියන් පිළිබඳ විනිවිද දකින සුලු සමාජ සමීක්ෂණ මේ රටේ අප්‍රමාණව කෘතීන් වශයෙන් සමාජය මතට ඉදිරිපත් වෙලා තිබෙනවා.

නමුත් අදටත් කුල ධූරාවලිය ප්‍රචණ්ඩත්වයකට මුහුණ දෙන උඩරට සහ වතුකරයේ දෙමළ ජනතාවගේ අසමානතාව ඊට බලපාලා තියෙනවා."

පෙනෙන ඇත්ත නොකියා සිටීම පුද්ගල වංචාවක්.

යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් දේවාල කට්ටඩි ආශ්‍රිතව පසුගිය සතිවල වාර්තා වුණු සිදුවීම් ගණනාවක් පිළිබඳව තොරතුරු පහත සඳහන් වේ.

දෙවියන් පිළිබඳ කතා පුවත් රට පුරාම ඇත. ඉන් කතරගම ප්‍රධාන තැනක් ගනී.

මේ වන විට රටේ ආර්ථික අවපාතය හා විශාල වශයෙන් මංකොල්ලකෑම් ධන හානි සිදුවේ.

කතරගම දෙවියන් වැඩවසන කතරගම ප්‍රදේශයේ කඩසාප්පු මංකොල්ලකෑම් දෛනිකව වැඩිවෙමින් ප්‍රවර්ධනය වෙමින් ජීවමානව කතරගම දෙවියන් වැඩවසන රටේ ජනතාව අතර ප්‍රසිද්ධ කතරගම

මංකොල්ලකෑම් හමුවේ කතරගම දෙවියන් නිහඬනම් උන්වහන්සේගේ අනුහස් ප්‍රශ්න කල යුතු නොවේද?

කතරගම නගරයේ සිල්ලර කඩ හා වෙනත් විවිධ පාරිභෝගික ද්‍රව්‍ය කඩ තිහකට වැඩි ප්‍රමාණයක් රාත්‍රී දොරවල් කඩා භාණ්ඩ හා මුදල් මංකොල්ලකෑම් සිදුවෙද්දී අනුහස් කතරගම දෙවිඳු කොයිද?

මීට අමතරව, කතරගම ප්‍රදේශයේ අතුරු මාර්ග වල ග්‍රාමීය නිවෙස් මංකොල්ලකෑම්ද මේ වන විට සිදුවෙමින් තිබේ.

වැදගත්ම සිද්ධිය නම් වන්දනාවේ පැමිණ කතරගම දෙවියන් වන්දනා කර යමින් සිටියදී වන්දනා කරුවන් මංකොල්ලකෑම් වලට ගොදුරු වීමය. පසුගිය තිස්වෙනි දින කතරගම අංක දෙක පාලම උඩදී වන්දනාවේ පැමිණ දේවාලය වන්දනා කර යමින් සිටි කාන්තාවකගේ පවුමක මාලයක් ද කඩාගෙන ගොස් තිබේ.

දෙවියනේ ඔබ කොයිද?

අනුහස් ඇති දෙවිවරුන් වැඩවසන ප්‍රදේශවල තත්ත්වය මෙසේ නම් රටේ සෙසු ප්‍රදේශවල තත්ත්වය කෙබඳු විය හැකිද?

කතරගම පළතුරු කඩවල මෙන්ම විවිධ වූ ස්ථාන තුල සිටින කතරගම තරුණයන් අයිස් වැනි මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී තිබීම මීට සාධක අතර එක් සාධකයකි.

පූජා භූමියක හා අවට ප්‍රදේශවල ප්‍රජාව මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමට පෙර කතරගම කඳ සුරිඳුන්ට සිය අනුහස් බලය තුලින් සමාජ සත්කාරයක් කල නොහැකිද?

මේ තත්ත්වය නිසා මේ වන විට කතරගමට යන බැතිමතුන්ගේ සංඛ්‍යාව සීමිත වෙමින් තිබේ.

ඇසල පෙරහැර මංගල්‍යයෙන් පසුව එළඹෙන අගෝස්තු මාසය කතරගම දේවාලයට අසුභ මාසයක් වන්නේ කපු මහත්වරු සහ බස්නායක නිලමේවරයා අතර අලුයට ගිනිමෙන් පවතින තණ්හා විරසකයයි.

ලංකාවේ පාතාලයින්ගේ දැවැන්තයෝ කතරගමට පුද පූජා පවත්වති. රට නසන පාතාල හා වෙනත් ජාවාරම් කරුවන්ට සහන සලසන බව පෙන්නුම් කරන සිද්ධියක් මෙහිදී පෙන්නුම් කල හැකිය.

අංගොඩ ලොක්කා යනු පාතාලයේ මැරයෙකි.

වර්ෂ 2019 ජූලි මාසයේ දී කතරගම පෙරහැර පැවැත්වෙමින් තිබුණි. ඔහුව නීතියෙන් ගලවා ගැනීම සඳහා ඔහුගේ බිරිය පවුම් 38 ක් බර රන් තැටියක් කතරගම දේවාලයට පූජා කර ඇත.

කොලොන්න ප්‍රදේශයේ පදිංචි කාරියක වන එම කාන්තාව පූජා කල රන් තැටිය කතරගම දේවාලයේ වැඩවසන දෙවියන්ගෙන් සොරාගෙන යන්න තරම් කපු මහතුන් සමත්විය. මේ පිළිබඳව පොලිස්පති සී.ඩී. වික්‍රමරත්නට ලැබුණු තොරතුරක් අනුව පසුගිය කාලයේ දී පොලිස් විමර්ශන පවත්වා ඇත.

එම පරීක්ෂණ කටයුතු සිදු කරන ලද්දේ කොළඹ අපරාධ කොට්ඨාශයේ විමර්ශන අංශයයි. පොලිස් කොට්ඨාශයේ අධ්‍යක්ෂක එවකට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ජනත් නන්දන මහතාගේ අධීක්ෂණය යටතේ නියෝජ්‍ය අධ්‍යක්ෂක සහකාර පොලිස් අධිකාරී නෙවිල් සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් පොලිස් කණ්ඩායමක් ඒ දිනවල කතරගමට ගොස් පරීක්ෂණ පවත්වා ඇත. තත්ත්වය මෙසේ නම් දෙවියන් වැඩසිටින මහා සුප්‍රසිද්ධ පූජා භූමියක තරම එසේ නම් රටේ සෙසු තත්ත්වය කෙබඳුවිය හැකිද?

පාරම්පරිකව දේවාල පවත්වාගෙන ශාන්තිකර්ම පවත්වන බවට එලෙස දේවාල පවත්වාගෙන යනු ලබන කපුවන්, කට්ටඩීන් පොදු සමාජය මුලා කරන තවත් සාධක තිබේ. එය නම්, ඓතිහාසික වංශකතා, ජාතක කතා හා වෙනත් ජනකතා වලින් මතු වී තිබෙන සාහිත්‍ය රසාස්වාදය නිසාද දේවාල, කට්ටඩි, ශාන්ති කර්ම පිළිබඳව පොදු සමාජයට ආත්මගත වන සාහිත්‍යමය අධ්‍යාත්මික එක් කතා වස්තුවක් පමණක් මෙහිදී සඳහන් කිරීම වැදගත්.

සීහල වස්තුව අටුවාවේ ලංකාවේ තිස්සදන නම් දනව්වේ මහදේව නැමැති උපාසකයා සිය වගාබිම් දෙස අසල ඉඳ මහා රෑ පැල් රකී. එවිට මහ රෑ ඒ පැල ඉදිරියේ විලාප හඬක් ඇසේ. වැරහිලි ඇඳගත් විරූපී මිනිසෙක් තම දුක කියා ඔහුගෙන් කෑමට යමක් ඉල්ලයි. උපාසකයා තමා ළඟ ඇති කෑමක් දුන් විට අදාල මිනිසා කටේ තබා ගන්නා විටම කෑම ගිනිගෙන අළු බවට පත්වේ. මෙම කෑම ඉල්ලන පුද්ගලයා ප්‍රේතයෙකු ලෙස උපන් අයෙක්. බලවත් කර්මයකින් ප්‍රේතයෙකු වූ බව කෑම දුන් උපාසකට පවසයි.

එවිට උපාසකයා නුඹ කල පව කුමක් දැයි අසයි. ප්‍රේතයා කියන්නේ ඔහු මනුස්ස ආත්මයකදී තම ධනයෙන් ජීවිතයක් ගත කල බවය. පංච ඉන්ද්‍රියන් සුපිරි ජීවිත ලෙස පින වූ ඔහු අනුන්ගේ දුකේදී තඹ සතයක මුදලක් වියදම් නොකල බව උපාසක ඉදිරියේ පවසයි. තම බලයෙන් හා ධනයෙන් කැමැත්තෙන් හෝ අකමැත්තෙන් ස්ත්‍රීන් වසඟ කර ගැනීමට සමත් වූ බවත් වැඩිදුරටත් පවසයි.

උපාසකයා සිල්වත් භික්ෂූන්ට පසුවදා භික්ෂූන්ට මේ බව කියා උන්වහන්සේලාට දන් දී ප්‍රේතයාට පින් අනුමෝදන් කල බව අදාල අටුවාවේ සඳහන් වේ. එකී දානමය බලයෙන් පසුදා රාත්‍රී ප්‍රේතයා රූමත් දිව්‍ය පුත්‍රයෙකු වී පැමිණ වෘක්ෂයකට මුවා වී උපාසකට ස්තුති කරයි. උපාසක මෙසේ අසයි. ඇයි සැඟව සිටින්නේ. එවිට අදාල දිව්‍ය පුත්‍රයා නිරුවතින් යැයි උත්තර දෙයි. ඊට කුමක් කලයුතු දැයි උපාසකයා ඇසූ විට සිල්වතුන්ට වස්ත්‍ර පූජා කරන්නැයි දාන බලයෙන් දිව්‍ය පුත්‍රයෙකු වූ පෙර ප්‍රේත චරිතය ඉල්ලා සිටි සිල්වතුන්ට වස්ත්‍ර පූජා කිරීම වැඩිදුරටත් උපාසක තැන ඉටු කරයි. ඉන් පසුවදා අදාල දෙවියා වී දිව්‍ය වස්ත්‍ර සහිතව පැමිණ උපාසකට ස්තූතිය පල කරයි. මේ සියල්ලක් අභෞතික, අභෞචමය, සිද්ධිමය, සුවිශාල අනුහස්මය සිද්ධීන් වලින් ගහණය. වින්දනයත්, ආස්වාදයත්, රසයත් අතීත ප්‍රජාව ලැබීමේ ප්‍රතිඵලය ප්‍රජාව තුල දේව, ප්‍රේත සිද්ධීන් තහවුරු වීමය. ඓතිහාසික සාහිත්‍ය තුල මනඃකල්පිත සිද්ධීන් අනන්තවත් අන්තර්ගතය.

මුඛ පරම්පරාවලදීද ජනශ්‍රැති හා වේදයන් තුලින් ද ශාන්ති කර්ම මිත්‍යා විශ්වාස පදනම් වූ ඓතිහාසික සාහිත්‍යයක් ලාංකික සමාජයට උරුම වී තිබේ.

ධර්ම ප්‍රචාරණය, අත්ත ලාභය, කීර්තිය, සමාජ ශික්ෂණය, රස වින්දනය තුල ගොනු වූ වංශ කතා, ජාතක කතා සාහිත්‍යයක්ද අපට තිබේ. අමාවතුර බිහිවෙන්නේ නොවියත් හුදී ජනයන් උදෙසාය. ධම්සරණ ලියවෙන්නේ සත්පුරුෂයන් සන්තෝෂ සඳහා ඇසුවනට ස්වර මෝක්ෂ සම්පත්තිය සඳහා ය. සද්ධර්මරත්නාවලිය ලියවෙන්නේ සත්පුරුෂයන්ට වැඩ සඳහා ය. සිදත් සඟරාව දුනුහුන්ට දැනුම සඳහා ය. පූජාවලිය අටවැදෑරුම් ලෝවැඩ සඳහා ය. කෙසේ වෙතත් ඓතිහාසික හා වංශ කතා සාහිත්‍ය තුලින්

අතීත, වර්තාමන, අනාගත ප්‍රජාව ප්‍රඥාවන්ත කිරීමට කෙතරම් දුරට සමත්වේද යන්න ගැටළු සහගත කරුණකි.

සම්භාව්‍ය සාහිත්‍ය තුලින් ලාංකික ප්‍රජාව ලද දැනුම එහි සංස්කෘතියකට තල්ලු කර තිබේද?

පුරවැසියන් දේශපාලනික, සමාජීය හා සංස්කෘතික හා ආර්ථික සෝදාපාලුවකට තල්ලු වී ඇත්තේ අගනා අතීත සාහිත්‍ය තුලින් ලද පසුගාමීත්වයද?

ඓතිහාසික සාහිත්‍ය ගොඩනැගී තිබෙන්නේ මානව සංස්කෘතිය පදනම් කර ගනිමින්ය. මේ නිසා රස වින්දනයට අමතරව ඥාන ගවේෂණයට නිර්මාණාත්මක චින්තනය අවධි කර ගැනීමට ඉතිහාස සංස්කෘතික අධ්‍යයනයට පරිකල්පන ශක්තීන් වර්ධනය කර ගැනීමට හා ප්‍රකාශන ශක්තීන් දියුණු කර ගැනීමට සාහිත්‍ය මහෝපකාරී වේ. විවිධ දිශානති වලට මිනිස් මනස මෙහෙය වීමේ ප්‍රබල හැකියාවක් සාහිත්‍ය සතු වේ.

නමුත් ලංකාවේ පුරවැසියන් දේශපාලනික, සාමාජීය හා සංස්කෘතික ආර්ථික සෝදාපාලුවකට තල්ලු වී ඇත්තේ අගනා අතීත සාහිත්‍ය තුලින් ලද පසුගාමීත්වය ද බෞද්ධ භික්ෂූන්ගේ වැදි බණ නිසාද?

ප්‍රජාව දේශපාලන තීරණයක් ගැනීමේදී සිතීමේ හැකියාව දූර්භාග්‍ය කරා යන ජීවන රටාවක් ගොඩනගා ගැනීමට සිතා මතාම ක්‍රියා කරන්නේ පව්කාර කමටද? නොදැනුවත්කමද?

සිය සාමාන්‍ය වෘත්තියට තමන්ම නිගාදීම කරගන්නේ ඓතිහාසික වැඩවසම් සංස්කෘතික හුරුපුරුදු නිසාද?

පසුව පුළුල්ව විවරණය කරගත යුතු පැති මේවා නොවේද?

කාලය අවකාශය දේශසීමා වලින් ඔබ්බට ගිය මිනිස්කම හා බැඳුණු අත්විදිය හැකි සාහිත්‍ය කලාවක් ලාංකික ප්‍රජාවට උරුම වී නැති නිසාද?

අධ්‍යාත්මය, සදාචාරය හා ජීවිතාවබෝධය මානව ලාංකික ප්‍රජාව අත්විදීමට අසමත් වී නිසාද?

විවිධ ජීවන කම්කටොළු වලින් ගැලවී සිටීමට, ජීවන ගැටලු ඉදිරියේ අකම්පිතව සිටීමට, දරා ගැනීමට, මුහුණදීමට රසවින්දනයට මගපාදන සාහිත්‍ය තුල වැඩවසම් ගති ලක්ෂණ ලාංකිකයාට ආත්මගත වී ඇති නිසා බොහෝ විට මිත්‍යා විශ්වාස මත සංස්කෘතියකට තල්ලු වී ඇත්තේ එවැනි ප්‍රවර්ධන ක්‍රියාමාර්ග ඔස්සේ දෛනිකව යැපෙන ජාවාරම් සංස්කෘතියක් තුල අප ආත්මගතව සිටින නිසාද?

මේ තත්ත්වය හමුවේ අද්භූත ජනක හෝ ප්‍රාතිහාර්ය එකක් හෝ කර පෙන්වීමෙන් රුපියල් දස ලක්ෂයක ඔට්ටුවක් තැබුවේ ලංකාවේ අවිද්‍යාවට එරෙහිව විශාල මෙහෙවරක යෙදුණු ඒබ්‍රහම් ටී කොවූර් මහතාය. ඉන්දියාවේ මිත්‍යාමත වලට එරෙහිව ක්‍රියාකල කොවූර් මහතා ලංකාවේ සිය කුලකය තුලින් මිත්‍යාවට තිත තැබීම සඳහා ලබාදුන් අභියෝගය ඉටු කිරීමට මෙතෙක් කිසිවෙකු හෝ සමත් වී නැත.

1. මුද්‍රා තැබූ කවරයක බහා තිබෙන මුදල් නෝට්ටුවක අනුක්‍රමික අංකය කීමට අභියෝග කිරීම.
2. මුදල් නෝට්ටුවක නිවැරදි පිටපතක් මවා පෙන්වීමට අභියෝග කිරීම.
3. අඟුරු මත හිටගෙන ගිනි පාගන අය පිළිස්සෙන් නැතුව කකුල් වල දියපට්ටා නොනැගෙන සේ ඍජුව විනාඩියක් සිටීමට අභියෝග කිරීම.
4. ඉල්ලන යම් වස්තුවක් මවා පෙන්වීම.
5. මනෝචාලක බල මගින් යම් වස්තුවක් චලනය කරවීම හෝ නැමීම.
6. පරචිත්තවිජානන බලයෙන් වෙනත් පුද්ගලයෙකුගේ සිතුවිලි කියන්න යැයි අභියෝග කිරීම.
7. සැත්කමකින් ඉවත් කෙරුණු අතක් හෝ පයක් යාඥා ආධ්‍යාත්මික බලය හෝ ඇඳැහිල්ලෙන් සුව කිරීමේ බලය සුද්ධ වූ අලු දේවාශිර්වාදය මගින් අඟලක් හෝ වැඩෙන්නට සැලැස්වීම.
8. යෝගී බලයෙන් ගුවනේ පාවීමට අභියෝග කිරීම.
9. යෝගී බල මගින් හෘදස්පන්දනය විනාඩි පහකට නැවැත්වීම.
10. යෝගී බල මගින් හුස්ම ගැනීම විනාඩි තිහකට නැවැත්වීම.
11. ජලය මත ඇවිද පෙන්වීම.
12. ශරීරය එක් තැනක තිබියදී වෙනත් තැනකින් මතුවී පෙන්වීම.
13. අනාගත සිදුවීමක් පාරභෞතික ක්‍රම මගින් පුරෝකථනය කිරීම.
14. අනුභූති උත්තර භාවනාවෙන් හෝ යෝගී භාවනා ක්‍රම මගින් බුද්ධි වර්ධනය හෝ මානසික ශක්තිය ලබාගෙන පෙන්වීම.
15. පුනරුත්පත්තිය ලැබීම හෝ සුද්ධ හෝ අසුද්ධ ආත්මයක වැහීම හේතුකොට ගෙන නොදත් භාෂාවක් කතා කිරීම හෝ තේරුම් ගැනීම පෙන්වීම.
16. ඡායාරූපයකට නැංවිය හැකි පරිදි ආත්මයක් හෝ අවතාරයක් ඉදිරිපත් කිරීම.
17. යම් ප්‍රස්තුතයක් ඡායාරූපයකට ගත් පසු එහි යම් අංගෝපාංග තල සේයා පටලයෙන් අතුරුදහන් කර පෙන්වීම.
18. අගුල් දා වැසූ කාමරයකින් අධ්‍යාත්ම බල යොදා එළියට ඒම.
19. ද්‍රව්‍යයක බර ප්‍රමාණය දිව්‍යමය බල මගින් වැඩි කිරීම.
20. අද්භූත බල මගින් සැඟවුණු වස්තුවක් සොයා ගැනීම.
21. වතුර පෙට්‍රල් බවට හෝ වයින් බවට පත් කිරීම.
22. වයින් රුධිරය බවට පත් කර පෙන්වීම.
23. දස දෙනෙකුගේ නිවැරදි උපන් වේලාවල් ආසන්නම විනාඩියට නිවැරදිව සහ උපන් ස්ථාන අක්ෂාංශ සහ දේශාංශ දුන් පසු ඔවුන්ගේ හස්ත රේඛා සටහන් කට්ටලයක් දුන් පසු ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය සහ මියගිය නොගිය බව කීම.

මේ අභියෝග කිසිවක් භාරගත් කට්ටඩි මහතෙකු යන්ත්‍ර මන්ත්‍ර ඇදුරෙකු තවම මතු වී නැත.



යන්ත්‍ර මන්ත්‍ර වලට මෑත කාලයේ ප්‍රකට වූයේ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ අනුරාධපුරයේ ඥාණා අක්කාගේ දේවාලයට ගිය පසුවය. අනුරාධපුර ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ වැඳ පුදා ගැනීමෙන් පසු ඥාණා අක්කාගේ දේවාලයට ගොස් පූජාවක් පවත්වා යලි නිවස බලා පැමිණෙමින් සිටියදී පොලිස් වෙඩි පහරට ලක් වූ උපාධිධාරී ඉරේෂා චාමරිගේ අකල් මරණය තුලින් උක්ත වන්දනාවේ අනුහස් හා දේව වන්දනාවේ අනුහස් කොයිබටද යන ප්‍රශ්නය තවදුරටත් සමාජය විසින් සංවාදය කලයුතු තත්ත්වයක් නොවේද?

සුමිත් කොඩිතුවක්කු විසිනි.